31

| Class | 371.12 |
| --- | --- |
| No | G15 |

# ශ්‍රී ලංකාවේ දුෂ්කර පාසල්වල ගුරුවරුන් වෘත්තීය සංවර්ධන අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී මුහුණදෙන ගැටලු

OPEN UNIVERSITY
74469

ටී.එම්. ගාමිණී

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

# සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන දුෂ්කර පාසල් ක්‍රමිකව වැසීයාමේ හා දුර්වල තත්ත්වයකට පත්වයාම වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රවණතාවයක් වුවත්, එම පාසල් සන්දර්භයේ ම ක්‍රියාත්මකවන ඇතැම් දුෂ්කර පාසල් සුවිශේෂී වර්ධනීය ලක්ෂණ පෙන්වමින් ක්‍රමික ව සංවර්ධනය කරා ගමන් කරන ස්වභාවයක් දක්නට ලැබේ. මෙම පසුබිම කෙරෙහි එම පාසල්වල සේවයේ නියුතු ගුරුවරුන්ගේ වෘත්තීය සාධනය තීරණාත්මක ව බලපාන සාධකයකි. ශ්‍රී ලංකාවේ දුෂ්කර පාසල්වල සේවයේ නියුතු ගුරුවරුන් සිය වෘත්තීය සංවර්ධන අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී මුහුණපාන ගැටලු මොනවා ද? යන්නත්, එම ගැටලු කෙරෙහි බලපාන ලද හේතු සාධක මොනවා ද? යන්නත් ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන ප්‍රස්තුතය විය. මෙහි දී ශ්‍රී ලංකාවේ දුෂ්කර පාසල්වල සේවය කරන ගුරුවරුන්ගේ ගුරුවෘත්තිය සම්බන්ධව සංජානන හඳුනා ගැනීම, දුෂ්කර පාසල්වල සේවයේ නියුතු ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනිම, දුෂ්කර පාසල්වල සේවයේ. නියුතු ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා සඳහා බලපාන සාධක හඳුනා ගැනීම සහ දුෂ්කර පාසල්වල ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා ඉටුකරගැනීමේ දී මුහුණපාන ගැටලු පිළිබඳ ව සොයාබැලීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය.අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමය වූයේ විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ සමීක්ෂණ ක්‍රමයයි. පර්යේෂණ අරමුණු වලට සමගාමී ව නියැදිය, දත්ත රැස්කිරීමේ ක්‍රම ශිල්ප හා පර්යේෂණ උපකරණ යොදා ගන්නා ලදී. වැල්ලවාය අධ්‍යාපන කලාපයේ පිහිටි සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපයන කටයුතු මෙහෙයවන දුෂ්කර පාසල් සහ අතිදුෂ්කර පාසල් දහයක අහඹු නියැදි ක්‍රමයට ලබාගත් ගුරුවරුන් පනස්හය දෙනෙකු ගුරු නියැදිය ලෙස යොදාගත් අතර අරමුණු ගත ව සකස් කළ ප්‍රශ්නාවලියක් මඟින් ඔවුන්ගෙන් දත්ත රැස්කෙරිණි. එමෙන් ම ගුරුවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන්, විෂය අධ්‍යක්ෂකවරුන්, ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් සමඟ කළ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මඟින් ද දත්ත රැස්කරන ලදී. ප්‍රශ්නාවලි මඟින් ලබාගත් දත්ත අරමුණු මත විශ්ලේෂණය කරන ලදී. ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව ලද තොරතුරු විශ්ලේෂණය කර ප්‍රතිශත, වගු, ප්‍රස්තාර සහ සරල සංඛ්‍යාන ක්‍රම භාවිතයෙන් අර්ථකථනය කෙරිණි. පර්යේෂණයට අදාළ සාහිත්‍ය විමර්ශනය න්‍යායාත්මක හා ආනුභවික වශයෙන් සිදු කෙරිණි. න්‍යායාත්මක විමර්ශනයේ දී පුහුණුවට හා අභිප්‍රේරණයට ආදාල න්‍යායන් හි ආදාලත්වය ද මෙරට ගුරු අධ්‍යාපනයේ ඓතිහාසික පසුබිම ද, ජපානයේ සහ ටැන්සානියාවේ ගුරු අධ්‍යාපනයේ පසුබිම ද විමර්ශනය කෙරිණි. ආනුභවික විමර්ශනයේ දී දේශිය හා විදේශිය පර්යේෂණ, අරමුණු ගත ව විමර්ශනය කරනු ලැබීය. අධ්‍යයනයේ අනාවරණ පර්යේෂණ අරමුණු ගත ව ඉදිරිපත් කරන ලදී. දුෂ්කර පාසල් හි ගුරුවරුන්ගෙන් සියයට 80ක් ගුරු වෘත්තිය පිළිබඳ ව ඉහළ සංජානනයක් දක්වන බවත්, සේවා කාලය, වයස, වෘත්තීය පුහුණුව හා වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීමට ඇති කැමැත්ත අතර ප්‍රතිලෝම සබඳතාවක් ඇති බවත්, ගුරු වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ ව ඉහළ සංජානනයක් නොමැති බවත් අනාවරණය විය. ගුරු වෘත්තිය සංවර්ධනය කෙරෙහි පෞද්ගලික සාධක මෙන් ම බාහිර සාධක බලපා ඇති බව පැහැදිලි වන අතර ගුරු වෘත්තිකභාවය හා ගුරු

සංවර්ධනය, වෘත්තීය ගරුත්වය හා වෘත්තීය වශයෙන් ඉදිරියට යෑම, රැකියා තෘප්තිය හා වැඩිදුර අධ්‍යාපනයට යොමුවීම, සිය නිවසින්, පාසලේ ගුරුවරුන්ගෙන් හා විදුල්පතිවරුන්ගෙන් ලැබෙන සහයෝගය ගුරුවරුන් වෘත්තීය සංවර්ධනය කෙරෙහි යොමුවිමට හේතු පාදක වී ඇති බව නිගමනය විය. ගුරුවරුන් දිගු කාලීන වෘත්තීය සංවර්ධන පාඨමාලා කෙරෙහි වැඩි නැඹුරුතාවක් දක්වන අතර ගුරුවරුන්ගෙන් සීමිත පිරිසක් වෘත්තීය සංවර්ධන පාඨමාලා වෙත යොමුවීම අපේක්ෂා නොකරන බව අනාවරණය විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිතය, විෂය සංවර්ධනය, අධ්‍යාපන තාක්ෂණය භාවිතය, අධ්‍යාපනයේ නූතන ප්‍රවණතා හා නවීකරණයන් හඳුනා ගැනීම, පන්ති කළමනාකරණය පිළිබඳව ඉගෙනීමට වැඩි නැඹුරුතාවක් ගුරුවරුන් තුළ පවතී. වෘත්තීයමය කුසලතා හා භාවිතයන් වැඩිදියුණු කරගැනීමට අවස්ථා සීමිත බවත්, වෘත්තීය සංවර්ධනයේ දී පෞද්ගලිකව හා පොදුවේ මුහුණදෙන ගැටලු රාශියක් පවතින  බවත්, ඇතැම් පාසල්වල වෘත්තීය සංවර්ධනයට පෙළඹවීම පහළ මට්ටමක පවතින බවත්, වර්තමාන ගුරු සංවර්ධන පාඨමාලා හා වැඩසටහන්වලට බඳවා ගැනීම, විෂයමාලාව, සම්පත්දායකයින්, ඉගැන්වීම් ක්‍රමවේද උචිත පරිදි සකස් නොවීම ගැටලු සහගත බවත් ගුරුවරුන් අති බහුතරයකගේ මතය යි. දුෂ්කර පාසල් හි ගුරුවරුන්ගේ ගුරුවෘත්තිය සංවර්ධනය ආශ්‍රිත ව පවත්නා ගැටලු නිරාකරණය කරගැනීම සඳහා ජාතික, පළාත්, කලාප හා පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික වැඩපිළිවෙළක් දියත් කිරීම කාලීන අවශ්‍යතාවක් බව ගුරුවරුන්ගේ මතයයි. ගුරු වෘත්තීය සංවර්ධනය ගුරුවරුන්ගේ පෞද්ගලික වගකීමක් නොව රජයේ වගකීමක් සේ සලකා ක්‍රියා කිරීම ඵලදායි ගුරු සංවර්ධනයකට හේතු වේ. ගුරු වෘත්තීය සංවර්ධනය ආශ්‍රිත ව පවත්නා පාඨමාලා නවීකරණය කිරීම, පාසල් පාදක ගුරු සංවර්ධනය වැඩි දියුණු කිරීම, ගුරු වෘත්තීය ඇගයීම් බලගැන්වීම හා ගුරු වෘත්තීය සංවර්ධන අවස්ථා පුළුල් කිරීම මඟින් වෘත්තීය සංවර්ධනය සඳහා ගුරුවරුන් අභිප්‍රේරණය කිරීමත්, ගුරු වෘත්තීය සංවර්ධනය ආශ්‍රිත ගැටලු නිරාකරණය කරගැනීමටත්, එය මෙරට දුෂ්කර පාසල්වල අධ්‍යාපනය නගාසිටුවීමටත්, පොදුවේ අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීමටත් හේතු වේ.

# Abstract

Even though certain schools in difficult areas of Sri Lanka are gradually being weaken and being abandoned, certain other difficult schools of in the same criteria are progressing towards development status. The professional performance of the teachers employed in these schools, are a critical factor for this situation. The main objective of this study is to identify and study the problems faced by teachers employed in difficult schools in Sri Lanka while achieving their professional developmental requirements and reasons for such problems. The study was conducted under the following main objectives. First objective is to identify the perception towards teaching profession of the teachers employed in difficult schools in Sri Lanka. Second objective to identify the professional development requirements, of teachers in the difficult schools in Sri Lanka. Third objective is to identify the factors that affect to the professional developmental requirements of teachers in Sri Lanka. Forth objective is to study the problems faced upon achieving the professional development and requirements of teachers of Sri Lanka. The methodology used for the study was "Survey Method". With con – currant to the research objectives samples, data collecting methods and research tools were used. The sample consisted of fifty six teachers who were selected on random basis from ten difficult Sinhala medium schools in Wellawaya Educational zone. The data was collected through an objective based questionnaire. Furthermore, data were collected via structured interviews carried out with teachers, principals, instructors, subject directors, teacher center managers and zonal education directors. Data review through questionnaire, were analyzed based on the objectives. Quantitative and qualitative data analysis was interpreted via percentages, charts, graphs and simple statistical methods. The literature review was done in the theoretically and empirically. In the theoretical review it was considered the training and motivation theories, historical background of Sri Lankan, Japanese and Tanzanian education systems. In the empirical review was based on local and foreign aimed amylases. And it was revealed that the majority of teachers in difficult schools showed high performance skills in teaching profession. Further there is an adverse relationship between teachers' service period, age, professional training and willingness to follow professional training courses. It was also revealed that the lack of higher professionalism towards existing teaching developmental courses. It was clear that teaching development is affected by both

personal and external factors. And it was concluded that the main factors for teachers to engage in professional development are teaching professionalism and teaching development, professional respect, and job satisfaction and engaging in higher education and corporation received from family members, coworkers and superiors. Tendency of majority teachers are towards long term professional developmental programmes while a limited numbers are not expected to go towards professional development. There is a higher tendency towards use of teaching learning methodology, techniques of education, identification of current trends in education, class room management. It is the perception of majority of teachers that opportunities for development of educational applications are inadequate. It was revealed that there are limited opportunities for professional development, there are lot of personal and common difficulties when achieving professional development, there is a low level of tendency towards professional development in some of the schools, also the recruitment, syllabus, resource persons, teaching methods are not up to the standards. To solve the problems of difficult school in Sri Lanka, it should be introduced several practical solutions to meet the current requirements. The professional development of teachers employed in difficult schools in Sri Lanka is not a personal responsibility but also a responsibility of the government. Update the current developmental courses, enhance the school based professional development, encourage the teacher's assessment methods, enhance the professional development opportunities, enhance the need of professional development attitudes of teachers, solve the matters in professional development methods will be positively affected to a productive development in Sri Lankan education system.